# පළමුවන වාර පරීක්ෂණය - 2018
# 13 ශ්‍රේණිය
# නාට්‍ය හා රංග කලාව - II කොටස **II - I**

**කාලය : පැය 2 යි.**

❖ **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

---

◆ **පහත දැක්වෙන සංවාද / කවි / ආශ්‍රයෙන් අංක 01 සිට 10 දක්වා පිළිතුරු සපයන්න.**

A - අසාලා කීවේ වගතුග සියල්ලක්
යොදාලා කීවේ බොරු බස් ඇසිල්ලක්
රවාලා කීවේ අපහට දෝසයක්
කපාලා දෙමිය ගම මහගෙ බරට ගාතයක්

B - අඳුන් ගාන්නී නෙත් දෙක ඔබරි කරන්නී
මල්ගවසන්නී කොන්ඩය ගොතා හෙලන්නී

C - බෝ වික්‍රම ඇති පවර දොළසක් දෙවියන්ට
මේ දැක්වූ දොළොස් පාලිය අඟට
සේසත් පිරිවරා එතෙර දෙවි නමට
මීමෙත් සොයා බැඳලා දෙවි පඬුරකට

D - අත්වැල්ගායක කණ්ඩායම
ඔහු ගියේ හරිම සිත් වේදනාවකින්
තරුණයකු කෝප උනොත් මොන මොනවා කරගනීද? ගියාවේ. ගියාවේ.

E - දීඝ - එහෙනම් ඔබ රජවාසලට ගියා
සුභ - ගියා විතරක් නෙවෙයි මම මහ වාසල ආරක්ෂක බලමුළුවේ සේනාපති

F - එමීලියා - මගෙ වරුණෙ ඔයා ලියන්න ඕන කරන්නේ නෑ
ඉයාගෝ - අපොයි නෑ

(01) මී බන්ධනය නම් නාට්‍යමය අවස්ථාව අඩංගු වන්නේ,
- (1) ගම්මඩු ශාන්ති කර්මය
- (2) සූනියම් කැපීමේ ය.
- (3) දහ අට සන්නියේ ය.
- (4) සන්නියකුන් යාගයේ ය.
- (5) කඩවර කංකාරියේ ය. (.......)

(02) උඩරට ප්‍රදේශයට ආවේණික ශාන්ති කර්මයකි.
(1) A (2) B (3) C (4) D (5) E (.......)

(03) ගම්මඩු ශාන්තිකර්මයට අයත් කවි / සංවාද අයත් අක්ෂරය වන්නේ,
(1) A (2) B (3) C (4) D (5) F (.......)

(04) "D" සංවාද ඛණ්ඩයට අයත් නාට්‍ය රචකයා වන්නේ,

(1) විලියම් ශේක්ස්පියර් (2) සොෆොක්ලීස්
(3) බර්නාඩ් ෂෝ (4) ඇන්ටන් චෙකොෆ්
(5) ඊඩිපස් පේ (______)

(05) සොෆොක්ලිස්ගේ නාට්‍ය නිර්මාණ අතරට,

(1) හැම්ලට් (2) ඔතෙලෝ (3) වැනීසියේ වෙළෙන්දා
(4) රෙක්ස් (5) චෙරිවත්ත (______)

(06) උඩරට පළාතට අයත් ජන නාටකයක් දැක්වෙන අක්ෂරය වන්නේ,

(1) A (2) B (3) C (4) D (5) E (______)

(07) සයිමන් නවගත්තේගම නාට්‍ය නිර්මාණයට අයත් සංවාද කණ්ඩය අයත් අක්ෂරය වන්නේ,

(1) B (2) C (3) E (4) F (5) B (______)

(08) උත්තර භාරතීය රාගධාරී සංගීතය යොදාගත් නාට්‍ය සම්ප්‍රදාය,

(1) නාඩගම් (2) නූර්ති (3) කුත්තු
(4) කෝලම් (5) නව නාට්‍ය (______)

(09) මහා කෝල සන්නි යක්ෂයා සම්බන්ධ වන යාතු කර්මය වන්නේ,

(1) සූනියම් යාගය (2) ඇත් බන්ධනය
(3) රිද්දි යාගය (4) සන්නි යකුන් යාගය
(5) කඩවත්තරණය (______)

(10) මිනර්වා නාට්‍ය ව්‍යාපාරයේ පුරෝගාමියා වූයේ,

(1) සී දොන් බස්තියන් (2) බී.ඒ.ඩබ්. ජයමාන්න
(3) සිරිසේන විමලවීර (4) චාල්ස් ඩයස්
(5) පිලිප්පු සිංඤෝ (______)

(11) මංගර දෙවියන් පුද ලබන නාට්‍යමය පෙළපාලියක් වන්නේ,

(1) අඹ විදමන (2) ආවැන්දුම
(3) මී බන්ධනය (4) දොළහ පෙළපාලිය
(5) ඌරා යක්කම (______)

(12) ''සොයන්නහු ද කවුරුන් මේ සොහොනෙහි''
මේ සංවාදය අයත් නාට්‍ය ප්‍රභේදය කුමක් ද?

(1) පාස්කු නාට්‍ය (2) මිස්ටරි නාට්‍ය (3) මිරැකල් නාට්‍ය
(4) මොරැලටි නාට්‍ය (5) අනාගාමික නාට්‍ය (______)

(13) ''අර්ථෝපක්ෂේප'' ක්‍රම අයත් වනුයේ,

(1) අර්ථ ප්‍රකෘතිවලට ය. (2) අවස්ථාවලට ය.
(3) සූච්‍ය කොටස්වලට ය. (4) ප්‍රයෝජ්‍ය කොටස්වලට ය.
(5) අධිකාරික කොටසට ය. (______)

(14) අභිඥානශාකුන්තලයට පදනම් වූ කථා වස්තුව හමුවන්නේ,

(1) කථාසරිත් සාගරය (2) රාමායනය

(3) මහාභාරතය (4) පද්ම පුරාණය

(5) කාලිදාස ස්වතන්ත්‍ර රචනයකි (.......)

(15) ට්‍රැජඩි සහ කොමඩි නාට්‍ය ප්‍රභේද ද්විත්වයම නිෂ්පාදනය කළ නාට්‍ය සම්ප්‍රදායක් වන්නේ,

(1) සංස්කෘත (2) රෝම (3) ග්‍රීක

(4) මධ්‍යකාලීන (5) ඇබ්සර්ඩ් (.......)

(16) ග්‍රීක නාට්‍යයේ ''රීගොස්'' යනු,

(1) නාට්‍ය සඳහා මුදල් යොදවන්නා (2) නාට්‍ය රචකයා

(3) අධ්‍යක්ෂකවරයා (4) නාට්‍ය නිෂ්පාදකවරයා

(5) ප්‍රධාන නළුවා (.......)

(17) ඇරිස්ටෝටල් න්‍යායේ වැදගත්ම ලක්ෂණය,

(1) චින්තනය (2) වස්තුව (3) වාග් විලාසය

(4) චරිතය (5) ප්‍රේක්ෂාව (.......)

(18) සබරගමුව කිරිමඩුවක අන්තර්ගත නාට්‍යමය අවස්ථා වන්නේ,

(1) මහා ඉපැද්දීම, අඹ විදමන, ආත් බන්ධනය, මී බන්ධනය

(2) වඩිග පටුන, දොළහ පෙළපාලිය, රාම මැරීම

(3) මරා ඉපැද්දවීම, අඹ විදමන, රාම මැරීම, ආත් බන්ධනය

(4) ඌරා යක්කම, ආවැන්දුම, අස්නේ

(5) නානුමුරය, කපුයක්කාරිය, දරු නැළවිල්ල (.......)

(19) කොහොඹා කංකාරියේ නාට්‍යමය අංගයක් නොවන්නේ,

(1) ඌරා යක්කම (2) ගබඩා කොල්ලය

(3) ආවැන්දුම (4) ගුරුගේ මාලාව

(5) නයා යක්කම (.......)

(20) ''ආකුලීකරණය'' යන්නෙහි අදහස වන්නේ,

(1) ගැටුම සමථයකට පත්වීම. (2) ගැටුම උච්චතම අවස්ථාවයි.

(3) ගැටුම ආරම්භයයි. (4) සිද්ධි මාලාවේ පරිවර්තනයයි.

(5) භාව විභේදනයයි. (.......)

(21) පාස්කු දර්ශන පවත්වන්නේ,

(1) ජේසුස් වහන්සේගේ උපත් කථා (2) වීර කථා

(3) බෞද්ධ කථා (4) පුරාණ කථා

(5) සුරඟන කථා (.......)

(22) පාස්කු ප්‍රචලිත ප්‍රදේශයක් නොවන්නේ,

(1) පිටිපන (2) දූවේ (3) යාපනය

(4) බේරුවල (5) පමුණුගම (.......)

(23) කෝලම් රංග ශෛලිය,

(1) නාට්‍ය ධර්මී වේ. (2) මිශ්‍ර වේ.

(3) ලෝකධර්මී වේ. (4) ඊටම ආවේණික ශෛලියක් ඇත.

(5) අර්ධ ශෛලිගත වේ. (______)

(24) සංස්කෘත නාට්‍යයේ කතා නායක, නායිකා සම්බන්ධ වන ප්‍රධාන කතා පුවත හඳුන්වන්නේ,

(1) විශ්කම්භ (2) ආධිකාරික (3) අංකමුඛ

(4) ප්‍රාසාංගික (5) ආරම්භ (______)

(25) නාඩගමේ විශේෂ ලක්ෂණය නොවනුයේ,

(1) නිශ්චිත පෙළක් නොමැති වීම ය.

(2) පොතේ ගුරු සිටීම ය.

(3) කර්ණාටක සංගීතය යොදා ගැනීම ය.

(4) පිරිමින් පමණක් රඟපෑමයි.

(5) පූර්ව රංගනයකින් පසු නාඩගම් ඉදිරිපත් කිරීමයි. (______)

(26) නාඩගම් පිරිහීමට හේතු වූයේ,

(1) නාඩගමට එරෙහිව සමාජ මතවාද ගොඩනැගීමයි.

(2) ඒකාකාරී උත්තර භාරතීය සංගීතය යොදාගැනීමයි.

(3) නූර්ති ආගමනයයි.

(4) නළු වෘත්තිය පිරිහීමයි.

(5) දිනපතාම පූර්ව රංගනයකින් පසු නාඩගම් ඉදිරිපත් කිරීමයි. (______)

(27) ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍යයේ පුරෝගාමියෙකි.

(1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) ශ්‍රී නිශ්ශංක (3) ලූෂන් ද සොයිසා

(4) වී. ආරියරත්නම් (5) E.F.C. ලුඩෝවයික් (______)

- **පහත වගුව ඇසුරෙන් පහත 28 - 32 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
| A - හැරමිටිය | B - තයිකෝ |
| C - එකුක්ලීමා | D - කයිතාලම |
| E - වංගෙඩිය | F - මෝල්ගහ |
| G - ඩෝල්කිය | H - ඔන්කොස් |
| I - පන්හිඳ | J - පුස්කොල පත්ඉරු |

(28) ජපන් නාට්‍ය සඳහා වාදනය කළ බෙරයකි.

(1) A (2) B (3) G (4) D (5) H (______)

(29) ''සෙල්ලපිල්ලේ'' භාවිතා කළ රංග භාණ්ඩය නම්,

(1) I හා J (2) A හා J (3) E හා H

(4) D හා G (5) F හා J (______)

(30) කෝලම් නාට්‍ය සඳහා භාවිතා වන රංග භාණ්ඩයකි.

(1) D (2) G (3) F (4) A (5) E (______)

(31) ග්‍රීක නාට්‍ය සම්ප්‍රදායට අයත් නාට්‍යෝපකරණ වනුයේ,

(1) BI (2) CH (3) BF (4) CD (5) BH (.......)

(32) උඩරට ජන නාටකයට අයත් වේ.

(1) GD (2) BF (3) AH (4) EF (5) DF (.......)

(33) සොකරි නාට්‍යයේ ඇති ශාන්තිකර්ම ලක්ෂණ අතරට,

(1) නැවක් තැනීම අයත් වේ.
(2) පැදුරු වියමන අයත් වේ.
(3) ගුරුන්වහන්සේ විසින් චරිත හඳුන්වා දීම අයත් වේ.
(4) පූජාර්ථ කවි ගායනා ඇතුළත් වේ.
(5) නාට්‍ය ධර්මී රංග ශෛලිය අනුගමනය කරයි. (.......)

(34) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ පැරණිතම නාඩගම ලෙස සැලකෙන්නේ,

(1) ඇහැළේපොල (2) ස්ථාක්කි (3) හරශ්චන්ද්‍ර
(4) චිත්‍රසේන (5) බුවනෙකබාහු (.......)

(35) පිලිප්පු සිංඤෝ විසින් 1824 දී නිර්මාණය කරන ලද නාඩගම,

(1) හරිශ්චන්ද්‍ර (2) ඇහැළේපොල (3) මාතලන්
(4) හෙලේනා (5) රජතුන්කට්ටුව (.......)

(36) රයිගම, මීගොඩ, පිටිගල, මිරිස්ස වැනි ප්‍රදේශයන්හි ප්‍රචලිත ජන නාටක විශේෂය වනුයේ,

(1) සොකරි (2) කෝලම් (3) පාස්කු
(4) නාඩගම් (5) නූර්ති (.......)

(37) ශ්‍රී ලංකාවේ කතෝලික ජනවන්දනා නාට්‍ය විශේෂයක් ලෙස සැලකෙන්නේ,

(1) පාස්කු ය. (2) ටීටර් ය. (3) නාඩගම් ය.
(4) නූර්ති ය. (5) කෝලම් ය. (.......)

(38) නූර්ති නාට්‍යයේ වාද්‍ය භාණ්ඩ ලෙස,

(1) තාලම්පට, ගැටබෙරය (2) හොරණෑව, දවුල
(3) සර්පිනාව, ඩෝල්කිය (4) මද්දලය, මෘදංගය
(5) සර්පිනාව, මද්දලය (.......)

(39) මහාචාර්ය ඊ.එෆ්.සී. ලුඩෝවයික් ගේ ඉංග්‍රීසි නාට්‍යයකි.

(1) Arms and the man (2) ලිලියොම් (Liliyom)
(3) The proposal (4) The Bear
(5) The Anniversory (.......)

(40) ප්‍රේක්ෂකයන් අඳුරේ හිඳගෙන, ඉවත් කරන ලද බිත්තියක් ඇති නිවසක සිදුව දෑ හොරෙන් නැරඹීම,

(1) නාට්‍ය ධර්මී ශෛලියයි. (2) තත්වානුරූපී මායාවයි.
(3) ලෝක ධර්මී රංග ශෛලියයි. (4) මිශ්‍ර ශෛලියයි.
(5) ස්වභාවික වාදයේ ලක්ෂණයයි. (.......)

# පළමුවන වාර පරීක්ෂණය - 2018
# 13 ශ්‍රේණිය
# නාට්‍ය හා රංග කලාව - II කොටස

## A කොටස

(01) (i) නූර්තිවලින් පසු සිංහල නාට්‍ය වෙනත් මඟකට ගෙන ගිය නාට්‍යකරුවන් කවුරුන්ද? (ල. 4)

(ii) ඔවුන්ගේ නාට්‍යවල විශේෂතා දක්වන්න. (ල. 5)

(iii) 1956 දක්වා නූතන සිංහල නාට්‍යයේ ඉතිහාසය දක්වන්න. (ල. 6)

(02) (i) නාඩගමෙහි මූලික ලක්ෂණ පහදන්න. (ල. 4)

(ii) නූර්ති ජනප්‍රිය වීමට හේතු දක්වන්න. (ල. 5)

(iii) නූතන නාට්‍ය කලාවට නූර්තිවල බලපෑම පිළිබඳ කෙටියෙන් දක්වන්න. (ල. 6)

(03) (i) සොෆොක්ලිස් විසින් ග්‍රීක නාට්‍ය කලාවට කළ සේවය කරුණු වශයෙන් දක්වන්න. (ල. 4)

(ii) ඛේදනීය වීරයන් මුහුණ දෙන අභාග්‍ය සම්පන්න අවස්ථාවක් විශ්ලේෂණය කරන්න. (ල. 5)

(iii) නාට්‍යාරම්භයේදීම ඉදිරියට පැමිණෙන ඊඩිපස් තම රටවැසියන් අමතන විලාසයෙන් ඔහු කොතරම් දයාභරිත පාලකයෙක් දැයි වැටහේ. (ල. 6)

## B කොටස

(01) (i) හෙන්රි ජයසේන විසින් නාට්‍ය කලාවට කළ සේවාව ඔහුගේ නාට්‍ය ඇසුරින් පහදන්න. (ල. 4)

(ii) කුවේණියට හෙළ හැතිරිය යැයි කී විට දිව්හත් - දිසාලා ඇගේ ස්වභාවික ගතිය ගායනයකින් විස්තර කරයි. විමසන්න. (ල. 5)

(iii) සිංහල ජාතියේ ආරම්භය වශයෙන් විජයාගමනය ඔබ පිළිගන්නේද? පිළිගන්නේ නම් ඒ සම්බන්ධව ගෙතී ඇති කතන්තර තුළින් ඉහත කියමන විමසන්න. (ල. 6)

(02) (i) ඊඩිපස් තුළින් නූතන විචාරකයන් විසින් හඳුන්වනු ලබන සොෆොක්ලියානු උත්ප්‍රාසය (Sophoclean Irony) පිළිබඳ හඳුන්වන්න. (ල. 4)

(ii) ග්‍රීක රංගය හා බැඳුණු සිද්ධාන්ත ප්‍රකට කිරීම නිසා සොෆොක්ලීස්ගේ ''ඊඩිපස්පේ'' නාට්‍යය සර්වකාලීන ව රස විඳිය හැකි කෘතියක් බව සනාථ කරන්න. (ල. 5)

(iii) ඊඩිපස් තුළින් මනුෂ්‍යාත්වභාවය පිළිබඳ උදාර අවබෝධයක් එනවා ප්‍රත්‍යාභිඥානයක් (Anagnoris) ඇති කරයි. විමසන්න. (ල. 6)

(03) (i) සොකරි නාට්‍යයේ පුරාවෘත්තය කෙටියෙන් පහදන්න. (ල. 4)

(ii) සොකරි නාට්‍යයේ පූජාර්ථ අරමුණු පැහැදිළි කරන්න. (ල. 5)